**ප්‍රාදේශීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (මධ්‍යම හා සබරගමු පළාත්) - 2013**

-----------------------------------------------------------------------------

ප්‍රාදේශීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ (මධ්‍යම හා සබරගමු පළාත්) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (ජ.ජා.ස.ආ.)සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්-පී 96 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවෙහි 4 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සම්පාදනය සහ කාලපරිච්ඡේදය

-----------------------------------------------------------------------------------------

ප්‍රාදේශීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ (මධ්‍යම හා සඹරගමු පළාත්) ණය ගිවිසුම අනුව මධ්‍යම හා සඹරගමු පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල සිටින ජනතාව සඳහා ප්‍රාදේශීය මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම තුළින් මාර්ග ජාලයේ සම්බන්ධතාවයන් හා විශ්වාසවන්තභාවය වැඩිදියුණු කිරීම මෙන්ම මාර්ග නියෝජිතායතයවල සහ කොන්ත්‍රාත්කරුවන්ගේ ආයතනික ධාරිතාවයන් ශක්තිමත් කිරීම තුළින් ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනයට සහ ප්‍රාදේශීය විෂමතාවයන් අඩු කිරීමට දායක වීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජපාන යෙන් මිලියන 11,171 ක් වන අතර ඉන් ජපාන යෙන් මිලියන 9,156 ක් මූල්‍යනය කිරීමට ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 සැප්තැම්බර් 01 දින ආරම්භ කළ අතර 2014 ජනවාරි මාසය වන විට අවසන් වීමට නියමිතව තිබුණි. පසුව ව්‍යාපෘතියෙහි කාලය 2015 මාර්තු 25 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

-----------------------------------------------

මාගේ විගණන පරික්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරික්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා

ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම් වගකීම් සහ ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘතිය කළමනාකරණයෙහිලා සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියෙහි මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීමට හැකිවන පරිදි පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙනු ලබන නියෝජිත ආයතනයෙන් ලැබුණු අරමුදල්වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් වූ වියදම්, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියෙහි ප්‍රගතිය, වැඩසටහනෙහි මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වීම පිණිස අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ නියමකර ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ වැඩසටහනෙහි අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේද යන බව,

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(උ) විශේෂ (යෙන්) ගිණුමේ ආරම්භක හා අවසන් ශේෂ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌණපූර්ණයන් ව්‍යාපෘතිය මඟින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ලං.ම.බැං) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඌ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

3. මතය

----------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයෙහි දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (යෙන්) ගිණුමෙන්, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි ප්‍රතිපූර්ණ සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණව විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව.

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

4. මූල්‍ය ප්‍රකාශන

-----------------

4.1 මූල්‍ය කාර්යසාධනය

----------------------

මූල්‍ය ප්‍රකාශනවලට හා විගණනයට ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ වියදම රු: 3,932,882,960 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු: 6,702,236,433 ක් විය. සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ ව්‍යාපෘතියෙහි වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ (කෙරීගෙන යන වැඩ) | 3,397,652,023 | 1,868,542,841 | 5,735,928,233 |
| පිරියත සහ යන්ත්‍ර | 100,686,719 | 6,173,000 | 106,859,718 |

| | | | |
|---|---|---|---|
| ලිබඩු සහ කාර්යාල උපකරණ | 324,035 | 205,791 | 775,745 |
| උපදේශක ගාස්තු | 247,198,043 | 163,994,441 | 515,863,800 |
| බැදීම් ගාස්තු සහ ණය පොළී | 52,642,795 | 42,477,891 | 115,430,405 |
| පරිපාලන පිරිවැය | 134,379,345 | 44,521,528 | 227,378,532 |
| | 3,932,882,960 | 2,125,915,492 | 6,702,236,433 |

**4.2 විශේෂ (යෙන්) ගිණුම**

---------------------------

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා විශේෂ (යෙන්) ගිණුමේ මෙහෙයුම් හා එම දිනට ශේෂය පහත දැක්වේ

| | ජපාන යෙන් | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 682,620,358 | 1,010,209,868 |
| එකතුකලා: ඌණ පූර්ණයන් | 1,918,770,255 | 2,555,071,382 |
| විදේශ විනිමය වාසි/(අවාසි) | - | (167,579,308) |
| | 2,601,390,613 | 3,397,701,942 |
| අඩු කලා: ආපසු ගැනීම් | 1,934,229,960 | 2,566,486,484 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 667,160,653 | 831,215,458 |

**5. විගණන නිරීක්ෂණ**

---------------------

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------------

පාරවල් 39 ක ප්‍රතිසංස්කරණ කටයුතුවල නිරත වූ කොන්ත්‍රාත් කරුවන්ගේ අතුරු ගෙවීම්වලින් අඩුකරගෙන තිබුණු රු: 330,321,579 ක රඳවාගත් මුදල් ව්‍යාපෘතියේ වගකීම් ලෙස හඳුනා ගෙන නොතිබුණි. මෙම නිසා කෙරීගෙන යන සිවිල් වැඩ වටිනාකම සහ 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවාගත් මුදල් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

----------------------------------------

### 6.1 අරමුදල් උපයෝජනය

------------------------------

අරමුදල් මූල්‍යනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන සහ සමාලෝචන වර්ෂය තුළදී අරමුදල් උපයෝජනයට අදාල ඇතැම් වැදගත් සංඛ්‍යා ලේඛන සහ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදල්වල තථ්‍ය උපයෝජනය පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යනය කිරීමට එකඟ වු මුදල | | 2013 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය | 2013 වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය | | 2013 දෙසැම්බර් 31 දක්වා සමුච්චිත අරමුදල් උපයෝජනය | | 2013 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය සමස්ත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|---|
| | ජ.යෙන් (මි.) | රු. (මි) | රු. (මි.) | ජ.යෙන් (මි.) | රු. (මි) | ජ.යෙන් (මි.) | රු. (මි.) | |
| ජ.ජා.ස.අ. | 9,156 | 11,628 | 3,004 | 2,216.38 | 2,938.26 | 3,805.82 | 5,296.78 | 46 |
| ශ්‍රී.ලං.ර. | 2,015 | 2,559 | 478 | 233.79 | 309.93 | 443.42 | 616.36 | 24 |
| | 11,171 | 14,187 | 3,482 | 2,450.17 | 3,248.19 | 4,249.24 | 5,913.14 | 42 |

2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාලපරිච්ඡේදයෙන් සියයට 75 ක් ඉක්ම ගිය පසුවද සමස්ත අරමුදල් ප්‍රතිපාදනයෙන් සියයට 42 ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය.

### 6.2 භෞතික කාර්යසාධනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරුවලට අනුව මධ්‍යම පළාතේ කිලෝමීටර් 75.40 ක් දිග මාර්ග 8 ක් සහ සබරගමු පළාතේ කිලෝමීටර් 75 දිග මාර්ග 6 ක් ව්‍යාපෘතියෙහි අධියර 1 යටතේ ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබුණු අතර එම වැඩ 2013 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට නියමිතව තිබුණි. එසේ වුවත් එම දිනට මෙම මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩවල භෞතික ප්‍රගතිය සියයට 56 සිට සියයට 96 දක්වා වූ පරාසයක විය. මෙයින් මධ්‍යම පළාතේ බෝගහවත්ත - මල්දෙණිය හන්දුනාව (CP1NE1) මාර්ගයේ ප්‍රතිසංස්කරණ වැඩ සහ සබරගමු පළාතේ උතුවන් කන්ද - උස්සපිටිය (SG1KG 3) පාර ප්‍රතිසංස්කරණ වැඩවල පිළිවෙලින් සියයට 56 ක් සහ සියයට 58 ක මන්දගාමී ප්‍රගතියක් දක්නට තිබුණි.

(ආ) තවද, ව්‍යාපෘතියෙහි අධියර 02 යටතේ ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබුණු මධ්‍යම පළාතේ කිලෝමීටර් 77.6 ක් දිග මාර්ග 07 ක් සහ සබරගමු පළාතේ කිලෝමීටර් 91.8 ක් දිග මාර්ග 13 ක ප්‍රතිසංස්කරණ වැඩ 2013 ජූනි 30 දින වන විට අවසන් කළ යුතුව තිබුණි. එසේ වුවත්, 2013දෙසැම්බර් 31 දිනට මෙම මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩවල භෞතික ප්‍රගතිය සියයට 21 සිට සියයට 82 දක්වා වූ පරාසයක විය.මධ්‍යම පළාතේ අංකෙලිපිටිය - උඩවෙල - අම්පිටිය මාර්ගයේ (CP2KD 7/8/9 ) සහ දෙල්තොට බෝපිටිය මාර්ගයේ (CP2KD103 ) ප්‍රතිසංස්කරණ වැඩවල ප්‍රගතිය සියයට 30 ක අඩු ප්‍රමාණයක් බව පෙන්නුම් කෙරුණු අතර සබරගමු පළාතේ මුවගම - තිරාගම - අළුපොත - යක්දෙහිවත්ත මාර්ගය (SG2RP2-A) සහ කොටමුල්ල -

කරන්ගොඩ - දිමිටියාව මාර්ගය (SG2RP3B) ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩපිළිවෙලින් සියයට 24 ක් සහ සියයට 21 ක මන්දගාමී ප්‍රගතියක් 2013 දෙසැම්බර් 31 දක්නට තිබුණි. මේ අනුව මෙකී ප්‍රතිසංස්කරණ වැඩ සැලසුම් කළ දිනවලදී නිම කිරීමට නොහැකි බව පෙන්නුම් කෙරේ.

(ඈ) ව්‍යාපෘතිය මඟින් සබරගමු පළාතේ පැකේජ 17 ක් යටතේ කිලෝමීටර් 146.8 ක් දිග මාර්ග 19 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ ආරම්භ කර තිබුණි. 2014 වර්ෂයේ අගෝස්තු මාසයේ දි සිදුකරන ලද භෞතික පරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(I) කොටමුල්ල - දිමියාව පාරේ 2+325 කිලෝමීටර ඉමේ ඇති පාලම ඉදිකිරීමේ කටයුතු කොන්ත්‍රාත්කරුගේ දුර්වලතාවයක් නිසා 2014 ජූලි මාසයේ සිට අත්හැර දමා තිබුණි. දෙපස සෝදා යාම නිසා මෙම පාලම මතින් වාහන ගමනාගමනය අනාරක්ෂිත බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(II) අරනායක අම්බලකන්ද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතුවල නියුතු කොන්ත්‍රාත්කරු නියමිත පාරිසරික ආරක්ෂණ වැඩපිළිවෙත් කොන්ත්‍රාත් වැඩබිම්වල අනුගමනය කර නොතිබුණි. එම නිසා භාරන ලද පස්, විශාල ගල් සහ වෙනත් කැලිකසළ මාර්ගය දෙපස ගොඩගැසීම පිළිබඳව සහ මාර්ග ඉදිකිරීම් කටයුතු වලින් වන වායු දූෂණය පිළිබඳව පළාතේ පදිංචිකරුවන් විසින් පැමිණිලි කර තිබුණි.

(III) ගැටහැත්ත - කරන්ගොඩ මාර්ගයේ (SG2RP4) 12+064 කිලෝමීටර් ඉම අසල පිහිටි පාලම අළුත්වැඩියා කර තිබුණු අතර වැසි කාලවලදී ගංවතුර තත්වයන් ඇතිවීමේ අවදානමක් ඇතිවන අයුරින් අළුත්වැඩියා කටයුතු වලදී ඉවත් කර තිබුණු කෝන්ක්‍රීට් කඳන් අසල පිහිටි දිය ඇලට පෙරලා දමා තිබුණු අතර එයින් දිය ඇල අවහිර වී තිබුණි.

(ඈ) ව්‍යාපෘතිය මඟින් මධ්‍යම පළාතේ පැකේජ 22 ක් යටතේ කිලෝමීටර් 163.3 ක් දිග මාර්ග 24 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ ආරම්භ කර තිබුණි. 2014 වර්ෂයේ ජූලි මාසයේදී සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(I) තැන්න - ඕවිටිකන්ද - දොඩම්දෙනිය පාර (CPIMT1) සහ කදුවෙල - වෙලිගල - ලෙලියම්බෙ පාර (CPIMT2) ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු 2013 දෙසැම්බර් 08 දින වන විට සැලකිය යුතු තරම් නිමකර තිබුණි. එසේ වුවත්, අදාල මාර්ගයේ පහසු සහ ආරක්ෂිත ගමනාගමනය සඳහා අවශ්‍ය මාර්ග සලකුණු සවිකර නොතිබුණු බව සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. තවද, දුර්වල මාර්ග සැලසුම් හා ගල්තාර ඇතිරීම හේතුවෙන් මාර්ගයේ වංගුවල බර උසුලන ප්‍රදේශ කැඩී තිබීම නිසා තැන්න - ඕවිටිකන්ද - දොඩන්දෙනිය මාර්ගයේ පළමු කිලෝමීටර් පහ තුළ ගමනාගමනය සැලකිය යුතු තරම් පහසු නොවන බව නිරීක්ෂණය විය.

(II) තණපිඩලි සේදී ගොස් තිබීම හා දියපාර අවහිර වීම හේතුවෙන් අම්පිටිය - උඩවත්ත මාර්ගයේ මීටර් 200 ක තණපිඩලි ඇල්ලීමේ වැඩ කටයුතු සතුටුදායක මට්ටමක නොවිණි.